









## අප ඉටුකරන කාර්යයන්

ජාත්‍යන්තර රතු කුරුස කමිටුව (ජාරකක) 1989 සිට ශ්‍රී ලංකාවේ සිය සේවා ඉටුකරමින් සිටී. ආරම්භයේදී දකුණේ ජනතා විමුක්ති පෙරමුණේ කැරැල්ලෙන් ද ඉන් පසුව ද්‍රවිඩ ඊලාම් විමුක්ති කොටි සංවිධානය සහ ශ්‍රී ලංකා රජය අතර රටේ උතුරේ සහ නැගෙනහිර පැවති ගැටුමෙන් පීඩාවට පත් අයගේ මානුෂවාදී අවශ්‍යතා සපුරාලීමට ද ප්‍රතිචාර දක්වමින් සිටී.

වර්තමානයේ ජාරකක අවධානය යොමුකොට ඇත්තේ කලින් පැවති ගැටුම නිසා පීඩාවට පත් ජනතාවගේ ඉතිරිව පවතින මානුෂවාදී අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමට අමතරව ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදා, ජාතික බලධාරීන් සහ අධ්‍යාපන විද්වතුන් අතර අන්තර්ජාතික මානුෂවාදී නීතිය ප්‍රවර්ධනය කිරීමටයි.

## රැඳවුම් ස්ථානවල තබාගෙන සිටින පුද්ගලයන්ගේ සුබසාධනය තහවුරු කිරීමට අදාල බලධාරීන්ට ආධාර කිරීම

ලොවපුරා ජාරකක ස්වකීය නිදහස අහිමි කරනු ලැබූ පුද්ගලයන් හමුවීමට යන්නේ දැඩි මානුෂවාදී වරමක් පදනම් කරගෙනය. එය සිදුවන්නේ පුද්ගලයන් රඳවා තැබීමට සහ ඔවුන්ට සැලකීමට ප්‍රමාණවත් තත්ත්වයන් ඇති බවට වගබලා ගැනීමට පුද්ගලයන් රඳවා ගැනීමේ බලධාරීන් දරණ උත්සාහයට ආධාර කිරීමට සහ රැඳවියන්ට පවුල් සමඟ සබඳතා පවත්වා ගෙනයාමට හැකියාව සැලසීමටයි. මෙම සංචාරවලින් පසුව ජාරකක තමන් සොයාගත් කරුණු සහ නිර්දේශ තිබේ නම් ඒවා මෙම බලධාරීන් සමඟ ද්විපාර්ශ්වික සහ රහස්‍ය පදනමක් යටතේ බෙදා ගනී.

මෙම වරම අනුව කටයුතු කරන ජාරකක 1989 සිට ශ්‍රී ලංකාවේ පුද්ගලයන් රඳවා ඇති ස්ථාන කරා යමින් පහත සඳහන් ආකාරයෙන් ආධාර කරයි:

- රතු කුරුස පණිවුඩ හුවමාරුව මගින් තම පවුල් සමඟ සබඳතා පවත්වා ගෙනයාමට රැඳවුම්භාරයේ පසුවන පුද්ගලයන්ට උපකාර කිරීම;
- වැසිකිලි, වතුර ටැංකි, මුළුතැන් ගෙවල්, බන්ධනාගාර වාට්ටු, සූර්ය විදුලි පනේල සවිකිරීම, වාතය ලැබෙන ක්‍රම වැඩිදියුණු කිරීම සහ සමහර ස්ථානවල වහල අළුත්වැඩියා කිරීම වැනි කුඩා පරිමාණ යටිතළ පහසුකම් අළුත්වැඩියා කිරීමට හෝ ඉදිකිරීමට දායකවීම;
- මූලික ස්වස්ථතා ද්‍රව්‍ය, ඇඳුම්, මෙට්ට සහ විනෝදාස්වාදය පිණිස අවශ්‍ය අයිතමයන් බෙදාදීම.

## පවුල් සමඟ නැවත සබඳතා ඇතිකිරීම

විදේශවලට යාමෙන් සහ ස්වාභාවික ආපදා නිසා පවුල්වලින් වෙන්වූ පුද්ගලයන් සහ ඔවුන් ගේ පවුල් අතර නැවත සබඳතා ඇතිකිරීමට ශ්‍රී ලංකා රතු කුරුස සමාජය ක්‍රියාත්මක කරන වැඩසටහනට ජාරකක ආධාර කරයි.

## අතුරුදන් වූ පුද්ගලයන්ගේ පවුල්වල මානුෂවාදී අවශ්‍යතා තක්සේරු කිරීම

කලින් පැවති ගැටුම හා සම්බන්ධව අතුරුදන් වූ පුද්ගලයන්ගේ පවුල්වලින් ඔවුන් සොයා දෙන ලෙස කරන ඉල්ලීම් 1990 සිට ජාරකක එකතු කරමින් සිටියි. අතුරුදන් වූ පුද්ගලයන්ගේ පවුල්වල විවිධාකර මානුෂවාදී අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමට අවශ්‍යවන විස්තීර්ණ ප්‍රතිචාරය ගැන මෙම සංවිධානයේ ද්විපාර්ශ්වික සහ රහස්‍ය එළඹුම් රාමුව තුළ ශ්‍රී ලංකාවේ බලධාරීන් සමඟ නිත්‍ය සංවාදයක් ඇතිකර ගෙන ඇත. ලෝක ව්‍යාප්තව මෙවැනි පවුල් සමඟ වැඩකිරීමෙන් අප සංවිධානය ලබා ඇති අත්දැකීම් සමුදායෙන් අවබෝධ කරගෙන ඇති කරුණක් වන්නේ ගැටුම් නිමාවීමෙන් අනතුරුව පවා දෙමව්පියන්, සොහොයුරන් හා සොහොයුරියන්, කලත්‍රයන් හා දරුවන් මානසික, නෛතික, පරිපාලන, සෞඛ්‍යය, සමාජ, ආර්ථික වැනි ගැටළුවලට මැදිවී ඔවුන්ගේ අතුරුදන් වූ ඥාතීන්ට අත්වූ ඉරණම සහ ඔවුන් සිටින්නේ කොහේදැයි දැනගැනීමේ අපේක්ෂාවෙන් පසුවන බවයි.

අතුරුදන් වූ පුද්ගලයන්ගේ පවුල්වල මානුෂවාදී අවශ්‍යතා අවබෝධ කරගැනීම පිණිස ජාත්‍යන්තර රතු කුරුස කමිටුව දීපව්‍යාප්ත තක්සේරුවක් කිරීමටත් එය පදනම් කරගෙන මෙම අවශ්‍යතා ආමන්ත්‍රණය කළ හැකි ආකාරය ගැන නිර්දේශ සකස් කිරීමටත් සූදානම් වෙයි.

## මානුෂවාදි ප්‍රතිපත්තිවලට ගරු කිරීම ප්‍රවර්ධනය

වසර ගණනාවක සිට ජාරකක පහත සඳහන් කටයුතු මගින් අන්තර්ජාතික මානුෂවාදී නීතිය ප්‍රවර්ධනයකොට ඇත.

- තමන්ගේ පුහුණු පාඨමාලාවලට සහ විෂයමාලාවට අන්තර් ජාතික මානුෂවාදී නීතියේ මූලධර්ම ඒකාබද්ධ කිරීම පිණිස ජාතික බලධාරීන්ට, ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවලට සහ අධ්‍යාපන ආයතනවලට ආධාර කිරීම;
- අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳ තම අවබෝධය පුළුල් කර ගැනීමට හැකිවන පරිදි මෙම ආයතනවල සාමාජිකයන්ට එතෙර රටවලදී පැවැත්වෙන අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳ සම්මන්ත්‍රණ, වැඩමුළු සහ සමුළුවලට සහභාගිවීමට අනුග්‍රහය දැක්වීම;
- නීති උපාධි අපේක්ෂකයන්ට අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳ ගැඹුරින් අවබෝධයක් ලබාගත හැකිවන පරිදි ජාතික වාද උසාවි තරඟ වාර්ෂිකව සංවිධානය කිරීම;
- සාම සාධක මෙහෙයුම්වලට සහභාගි වන සන්නද්ධ හමුදා සාමාජිකයන්ට අන්තර් ජාතික මානුෂවාදී නීතිය පිළිබඳව කරුණු විස්තර කිරීම.

## පුහුණු පාඨමාලා මාර්ගෝපදේශ සංග්‍රහය සහ භාවිතයන්ට මානුෂවාදී ප්‍රතිපත්ති එක් කිරීම

ප්‍රජාපාදක මහජන සාමය කළමනාකරණය සහ බලය සහ ගිනි අවි භාවිතය අතර ඇති සම්බන්ධතාව ගැන සහ අන්තර්ජාතික මානව හිමිකම් නීතිය පිළිබඳව නිලධාරීන්ට පුහුණුව ලබාදීමේදී ජාරකක ශ්‍රී ලංකා පොලීසියට ආධාර දෙයි.



© ICRC/M Kamil

## පීඩාවට පත්වූ නිවැසියන්ට සහ ප්‍රජාවන්ට ආර්ථික සුරක්ෂිතතාව සැලසීම

කලින් පැවති ගැටුමේ ප්‍රතිඵලයක් ලෙස වඩාත් පීඩාවට පත් අයගේ සහ ආපසු පදිංචිය සඳහා පැමිණෙන ප්‍රජාවන්ගේ ජීවනෝපායන් ඉහළ නැංවීම පිණිස ප්‍රජාපාදක ජීවනෝපාය ආධාර වැඩසටහනක් උතුරු පළාතේ දියත්කොට ඇත. ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතා සහ ප්‍රමුඛතා පදනම්කොට ගෙන ධීවර, කෘෂිකර්ම, සත්ව පාලනය සහ කුඩා ව්‍යාපාර යන ජීවනෝපාය අංශවලට මෙම වැඩසටහන ආධාර දෙයි.

ක්ෂුද්‍ර ආර්ථික මූලාරම්භ වැඩසටහන යටතේ කාන්තාවන් ගෘහ මූලිකත්වය දරන පවුල්වලට, කලින් පැවති ගැටුම හේතුවෙන් ආබාධිත තත්ත්වයට පත්වූවන්ට, උතුරු පළාතේ පුනරුත්ථාපනය කොට නිදහස් කරන ලද පුද්ගලයන්ට පවතින ජීවනෝපායක් යළි පටන් ගැනීමට හෝ නව ජීවනෝපායක් ඇරඹීමට ආධාරකර ඇත.



© ICRC

## පිරිසිදු පානීය ජලය ලබාගැනීමට සහ සනීපාරක්ෂක පහසුකම් සලසමින් ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම

අනුරාධපුරය, මඩකලපුව, කිලිනොච්චි, මුලතිව් සහ පොලොන්නරුව දිස්ත්‍රික්කවල සිවිල් ජනතාවට වැසිකිලි සහ නළ පද්ධති සමඟ උඩ වතුර ටැංකි ඉදිකිරීමේ, විවෘත ළිං අලුත් වැඩියා කිරීමේ, ළිං පිරිසිදු කිරීමේ වැඩසටහන්වලින් ප්‍රතිලාභ අත්වී ඇත.

## ශ්‍රී ලංකා රතු කුරුස සමාජය සමග සහයෝගයෙන් වැඩකිරීම

ජාරකුක මෙරට ජාතික හවුල්කරු වන ශ්‍රී ලංකා රතු කුරුස සමාජයට කලින් පැවති ගැටුමෙන් සහ ස්වාභාවික ආපදා නිසා පවුල්වලින් වෙන්වූ පුද්ගලයන් සහ ඔවුන් ගේ පවුල් අතර නැවත සබඳතා ඇතිකිරීමට, ප්‍රචාරණයට, මූලික මානුෂවාදී ප්‍රතිපත්ති හා අගයන් ප්‍රවර්ධනයට, ප්‍රථමාධාර සේවා සැපයීමට, පුද්ගලයන් සෙවීම හා ජීවිත ගලවා ගැනීමට අදාල කාර්යයන් ඉක්මනින් තක්සේරු කිරීමට හැකි හදිසි ප්‍රතිචාර ධාරිතාව සංවර්ධනයට ආධාර කරයි. ශ්‍රී ලංකා රතු කුරුස සමාජයේ කිලිනොච්චිය සහ මුලතිව් ශාඛා යළි පිහිටුවීමට ද ජාරකුක මුදල්, තාක්ෂණ සහ ද්‍රව්‍ය ආධාර සපයා ඇත.

## මෙහෙවර

අපක්ෂපාතී, මධ්‍යස්ථ සහ ස්වාධීන සංවිධානයක් වන ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ සුවිශේෂී මානුෂවාදී මෙහෙවර වන්නේ සන්නද්ධ ගැටුම් සහ වෙනත් ප්‍රචණ්ඩ තත්ත්වයන්හි වින්දිතයන් ගේ ජීවිත සහ ගරුත්වය ආරක්ෂා කිරීම සහ ඔවුන්ට ආධාර සැපයීමයි. අන්තර්ජාතික මානුෂවාදී නීතිය සහ විශ්ව මානුෂවාදී මූලධර්ම ප්‍රවර්ධනය කරමින් සහ ශක්තිමත් කරමින් මිනිසුන්ගේ දුක්වේදනා නිවාරණයටද ජාත්‍යන්තර රතු කුරුස කමිටුව ප්‍රයත්න දරයි. 1863 දී පිහිටුවන ලද ජාත්‍යන්තර රතු කුරුස කමිටුව ජිනීවා සම්මුති සහ අන්තර්ජාතික රතු කුරුස සහ රතු අඩසඳ සංවිධානයේ මුල් සංවිධානයයි. මෙම කමිටුව සන්නද්ධ ගැටුම් සහ වෙනත් ප්‍රචණ්ඩ තත්ත්වයන්හිදී මෙම සංවිධානය ඉටු කරන අන්තර්ජාතික කාර්යයන් මෙහෙයවීම සහ සම්බන්ධීකරණය කරයි.

ICRC

International Committee of the Red Cross
29, Layards Rd, Colombo 05
Sri Lanka
T + 94 (11) 250 33 46   F + 94 (11) 250 33 48
E-mail: col_colombo@icrc.org   www.icrc.org

2014 0117/259 09.2014 1000

Photo cover: ICRC



# ශ්‍රී ලංකාවේ ICRC ක්‍රියාකාරකම්

25 ICRC in Sri Lanka years of humanitarian action

ICRC

IN BRIEF